# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2130/46 – 2019 ජූලි 05 වැනි සිකුරාදා – 2019.07.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2013 නොවැම්බර් මස 22 වැනි දින අංක 1837/56 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි (460 වැනි අධිකාරිය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2013 අංක 348 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත 1 වන උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/10/2011/LRB/44.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය: GCF/ATH/KD/21A/LR.
2019 ජූනි මස 25 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 477 තලංගම උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, තලංගම උතුර, තලංගම දකුණ (කඩුවෙල මහනගර සභා සීමාව තුළ) ගම්වල පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කො 9681 හා 2017.06.28 දිනැති මූලික පිඹුරේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 01 – දෙල්ගහකුඹුර හෙවත් පොට්ටවල කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0948**

උතුරට: ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, වරි. අංක සොයාගත නොහැකි ඩබ්. කේ. පෙරේරා හිමිකම් කියන ඉඩම; නැගෙනහිරට: ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, වරි. අංක සොයාගත නොහැකි ඩබ්. කේ. පෙරේරා හිමිකම් කියන ඉඩම සහ සෙත්සිරි මාවතේ වරි. අංක 342/7 දරන ඉඩම; දකුණට: සෙත්සිරි මාවතේ වරි. අංක 342/7 දරන ඉඩම සහ කො. 8559 වැනි මූලික පිඹුරේ කැබලි අංක 3; බටහිරට: කො. 8559 වැනි මූලික පිඹුරේ කැබලි අංක 3 සහ ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත.

02. **කැබලි අංක 03 – විලේකුඹුර නොහොත් පොකුවිල කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.1861**

උතුරට: ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කැබලි අංක 2 සහ කො. 8559 වැනි මූලික පිඹුරේ කැබලි අංක 3; නැගෙනහිරට: කො. 8559 වැනි මූලික පිඹුරේ කැබලි අංක 3 සහ සෙත්සිරි මාවතේ වරි. අංක 342/5 දරන ඉඩම; දකුණට: සෙත්සිරි මාවතේ වරි. අංක 342/5 දරන ඉඩම සහ කැබලි අංක 4; බටහිරට: ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත.

07 - 680

1A – G30455 – 16 (2019/07)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*